## <u>පැමිණිලි සම්බන්ධයෙන් අපගේ ක්‍රියා පටිපාටිය – LOLC ෆිනෑන්ස් පීඑල්සී</u>

ඔබගේ ප්‍රතිචාර අපට අතිශයින්ම වැදගත්. අපගේ සේවාවන් ඔබගේ මූල්‍ය අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් නම්, කරුණාකර අපට දන්වන්න. අපි එම සෑම කරුණක්ම උපරිම ප්‍රමුඛතාවකින් සලකන අතර අදාළ ගැටළු පිලිබඳ අවධානය යොමුකොට, ඒවා කඩිනමින් විසඳීමට කැපවී සිටිමු. ඔබගේ විමසීම් සහ පැමිණිලි අපගේ සේවාවන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සැබැවින්ම උපකාරී වේ.

---

**අප හා සම්බන්ධ වන්නේ කෙසේද ?**

**අප වෙත පැමිණීමෙන් -**

ඔබට ළඟම ඇති LOLC ෆිනෑන්ස් ශාඛාව වෙත පැමිණ ශාඛා කළමනාකරු සමඟ කතා කරන්න. ඔබට සම්බන්ධතා කළමනාකරුවෙකු ලබාදී ඇත්නම්, ඔබට ඔහු /ඇය දුරකථනයෙන්, තැපැල් මඟින් හෝ ඊ-මේල් මාර්ගයෙන් සෘජුවම සම්බන්ධ කර ගත හැක.

**ඊ-මේල් මඟින්,**

info@LOLCFinance.com

**තැපෑලෙන්,**

**පාරිභෝගික සේවා ප්‍රධානී,**
LOLC ෆිනෑන්ස් පීඑල්සී
501, ගාලු පාර,
කොළඹ 06.
ශ්‍රී ලංකාව.

**දුරකථනයෙන්,**

**පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය - 1317**
*(සතියේ දිනවල පෙ.ව. 8:30 සිට ප.ව. 5:00 දක්වා ඇමතිය හැක.)*

සේවා ගුණාත්මකභාවය පිලිබඳ අරමුණු සඳහා ඇමතුම් පටිගත කළ හැකි බව කරුණාවෙන් සලකන්න. ඔබගේ පැමිණිල්ලේ රහස්‍ය තොරතුරු හෝ වැදගත් ලියකියවිලි අඩංගු වේ නම්, අප හා තැපෑලෙන් සම්බන්ධ වන ලෙස නිර්දේශ කරමු. ඊ-මේල් මඟින් සිදුකරන සියලුම විමසීම් සඳහා ඊ-මේල් මඟින්ම ප්‍රතිචාර දක්වනු ලැබේ.

---

**අප සිදුකරන දෑ -**

- ඔබගේ ගැටලුව හැකි ඉක්මනින් විසඳීමට අපි උත්සාහ කරන්නෙමු.
- ඔබගේ පැමිණිල්ල ලැබුණු විගස, එය අපගේ පැමිණිලි කළමනාකරණ පද්ධතියේ සටහන් කරන අතර විශේෂිත යොමු අංකයක් ලබාදේ.
- ඔබගේ පැමිණිල්ල ලැබුණු බවට දැනුම්දීමක් සමඟ යොමු අංකයක් ඔබට ලැබෙනු ඇත.
- ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් අපගේ කඩිනම් විසඳීමේ ක්‍රියාපටිපාටිය හරහා කටයුතු කරනු ලබන අතර, අවසාන ප්‍රතිචාරය හෝ විසඳුම දින 21ක් ඇතුළත ලබා දෙනු ලැබේ. (අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම් ඔබට නිසි ලෙස දැනුම් දීමක් සිදුකෙරේ)
- විමර්ශනය අතරතුර, අප විසින් අමතර තොරතුරු ඉල්ලා සිටිය හැක. අදාළ විස්තර කඩිනමින් ලබා දෙමින් සහාය දැක්වීම අපි අගය කොට සලකමු.

---

**ඔබ තවදුරටත් සෑහීමට පත් නොවන්නේ නම්,**

අපගේ අවසාන ප්‍රතිචාරය ලබාදීමෙන් පසුවත් ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, මූල්‍ය ආයතන සමඟ ආරවුල් විසඳීම සඳහා ස්වාධීන සේවාවක් නොමිලයේ ලබා දෙන මූල්‍ය ඔම්බුඩ්ස්මන් සේවාවෙන් ඔබට සහාය ලබා ගත හැකිවේ.

කරුණාකර පළමුව අප හා සම්බන්ධ වන්න. ඔම්බුඩ්ස්මන්වරයා මැදිහත් වන්නේ ඔබගේ පැමිණිල්ල අප විසින් සමාලෝචනය කිරීමෙන් පසුව පමණි.

---

**මූල්‍ය ඔම්බුඩ්ස්මන් සේවාව හා සම්බන්ධ වන්නේ කෙසේද?**

**තැපැල මාර්ගයෙන්:**

මූල්‍ය ඔම්බුඩ්ස්මන්
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය,
143A, වජිර පාර
කොළඹ 05
ශ්‍රී ලංකාව.

**දුරකථනයෙන්**: +94 112 595 624 / 5
**ඊ මේල් මඟින්**: fosril@sltnet.lk
**වෙබ් අඩවිය**: www.financialombudsman.lk

---

LOLC ෆිනෑන්ස් පීඑල්සී හි අපි, උපරිම මට්ටමේ පාරිභෝගික තෘප්තියක් ලබා දීම උදෙසා කැපවී සිටිමු.